## ප්‍රජා පාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය

ව්‍යාපෘතීන්හි තිරසාර පැවැත්මේ අවශ්‍යතාවය හෝ ප්‍රදේශය තුළ රැකියා අවස්ථා ජනනය කිරීම වැනි ඇතැම් නිශ්චිත සමාජීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිවලට ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහභාගිත්වය ලබා ගැනීම අපේක්ෂා කෙරේ.ඉහත අරමුණට යටත්ව සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලැබූ නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත වන කමිටුවක නිර්දේශය මත පහත සඳහන් නිර්දිෂ්ඨ කොන්දේසිවලට යටත්ව ඉදිකිරීම් වැඩ ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අනුමත සමිතිවලට භාර කළ හැකිය.

| කොන්දේසි | තක්සේරුව | අනුමත සමිති |
|---|---|---|
| ★ ප්‍රසම්පාදන අස්ථිත්වය ඇගයීමක් සිදුකර වැඩ ඉටු කිරීම සම්බන්ධයෙන් සමිතියේ ධාරිතාව ගැන සෑහීමකට පත්විය යුතුය.<br>★ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර අඩු තරමින් වසර දෙකකට කලින් සමිතියක් වශයෙන් ලියාපදිංචි කර තිබිය යුතුය.<br>★ එලෙස භාර කරනු ලැබූ වැඩ සමිතියේ බල ප්‍රදේශය සහ අධික්ෂණ සීමාව තුළ විය යුතුය.<br>★ පවරන ලද වැඩ උප කොන්ත්‍රාත් නොදිය යුතුය.<br>★ කිසියම් නිශ්චිත කාලයක් තුළ සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතුය.<br>★ දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්තුවල ඉතිරි කොටසේ මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකම එකතුව රු: මිලියන 2 නොඉක්මවිය යුතුය. | සමිතිය විසින් පහත කරුණු සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.<br>1. එම සමිති M8 ශ්‍රේණිය හෝ ඊට ඉහළ ශ්‍රේණියක් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ ක්‍රමය යටතේ "ඉක්ටාඩ්" ආයතනයේ ලියාපදිංචි වී සිටින බව :<br>2. කමිටුවේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කළ යුතුය :<br>(අ) බැංකු ප්‍රකාශ වශයෙන් මූල්‍ය සම්පත් අයිරා පහසුකම් අනුමත කරන බැංකු ලිපි ආදිය :<br>(ආ) සමාන වැඩ පිළිබඳව පෙර පළපුරුදුකම්:<br>(ඇ) ඉකුත් වසර (3) තුළ ඔවුනට පිරිනමන ලද කොන්ත්‍රාත් වැඩ පිළිබඳව සමිතියෙන් ප්‍රකාශයක්. එය තුන් (3) අවුරුද්දකට පෙර පිරිනමන ලද නමුත් අසම්පූර්ණ කොන්ත්‍රාත් වුවද කම් නැත.(කොන්ත්‍රාත් නාමය, ස්ථානය, සේවාදායක,කොන්ත්‍රාත්තුවේ වටිනාකම සහ වර්තමාන තත්ත්වය ) : සහ<br>(ඈ) වැඩය උප කොන්ත්‍රාත් නොදෙන බවට සමිතියෙන් ප්‍රකාශයක්: | ★ සමෘද්ධි බලකායන්/ සමෘද්ධි සමිති:<br>★ විවිධ සේවා සමූපකාර සමිති:<br>★ සමූපකාර කම්කරු සමිති ( කම්කරු සේවා පමණි)<br>★ ග්‍රාම සංවර්ධන සමිති:<br>★ පාසැල් සංවර්ධන සමිති (බල සීමා ප්‍රදේශය අදාල පාසැල් පරිශ්‍රය පමණි)<br>★ අදාල බලධාරීන් විසින් අනුමත ගොවි සංවිධාන:<br>★ ග්‍රාමෝදය මණ්ඩල සහ ප්‍රජා සංවර්ධන සමිති (පළාත් පාලන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු වලට දායක වන්නාවූ සමිති ):<br>★ ගැමි දිරිය මහජන සමාගම්<br>★ සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය යටතේ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය කළමණාකරණ සංස්ථා<br>★ විහාරස්ථ කාර්ය සාධක සමිති (ස්වකීය විහාරස්ථාන හා දහම් පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)<br>★ විහාරස්ථ දායක සභා (ස්වකීය විහාරස්ථාන හා දහම් පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක) |

යෝජිත පරිපාටි ණය ගිවිසුමෙහි කෙටියෙන් ගෙන හැර දක්වා ඇත්නම් ප්‍රජා පාදක සංවිධානයට ඍජුවම කොන්ත්‍රාත්තුව පිරිනැමීම විදේශ අරමුදල් ව්‍යාපෘතිය යටතේ කළ හැකි වේ.